# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2094/6 - 2018 ඔක්තෝබර් මස 22 වැනි සඳුදා - 2018.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකියුවීඑන්/ඒ1/2/57.*
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/2/2016/වීඊ/267.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අටුළුගම් කෝරළයේ බටහිර සුළු කොට්ඨාසයේ, අංක 116හි කනංගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අටුළුගම ගමේ පිහිටි මූලික පිඹුරු අංක කෑ/3559 හා 2018.06.20 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 2 දක්වා (කැබලි 2ට මායිම්)

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: සඳහන් නොවේ; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැළණිවැලි වැවිලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10: ප්‍රමාණය: හෙක්ටයාර් 0.0513.

**2. කැබලි අංක 01**

ඉඩමේ නම: දේවාලකන්ද වතුයාය-අක්කරමලය කොටස; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 15-20 වයසැති රබර් වගාව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැළණිවැලි වැවිලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10: ප්‍රමාණය: හෙක්ටයාර් 1.7049.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 27 වැනි දින පෙ. ව. 10.00 ට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 දෙසැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරය, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුයි.

යූ. ජී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-316

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G28777 – 17 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.